# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2197/6 - 2020 ඔක්තෝබර් මස 13 වැනි අඟහරුවාදා - 2020.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIVPANN/LND/ACDEP/1/4/12.
ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය : 4-3/8/2017/PC/63.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තු කෝරළේ බටහිර ඉංගරදවුල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2020.07.21 දිනැති අවසාන ගම් පිඹුර 341, පත්‍ර අංක 8, අතිරේක අංක 8 දරන පිඹුර මගින් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5939ක් වූ පහත විස්තර කෙරෙන බිම් කැබැල්ල.

01. **කැබලි අංක 130**
ඉඩමේ නම: ඉඳිගහවෙල වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත. අවු. 35-40 වයසැති පොල් ගස් 23ක්, පොල් පැල 8ක් සහිත මිශ්‍ර වගාවක් , ස්ථිර ගොඩනැගිලි 3ක්, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.5939

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 25 වැනි දින පෙ. ව. 10.00 ට පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 නොවැම්බර් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පන්නල.

10 -1047




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/7/16/2.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2017/එල්ඕ/513.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ 515 බී වලපනේ ග්‍රාම නිළධාරි වසමේ වතුමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2020.06.08 දිනැති මූලික පිඹුරු අංක නු3362හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4446 ක් වන කැබලි අංක 1, 2න් පෙන්වා දී ඇති ඉඩම්;

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: මුල්හල්කැලේ වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් පරිහරණය: වත්ත, තාවකාලික මිශ්‍ර භෝග වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0322.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මුල්හල්කැලේ වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 3ක් සහ තාවකාලික මිශ්‍ර වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4124.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 23 වැනි දින පෙ. ව. 10.00 ට වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 නොවැම්බර් මස 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

පී. එච්. සාලිය බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2020 ඔක්තෝබර් මස 09 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය

10 -1048

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.